


**සනත් පියසේන**

15

නිර්මාණකරුවෙකුගේ මතක සටහන්

# සයිකල් සූරයා

*මැණිකෙ පොඩි අම්මාත් ''ඉකේයි'' කියාගෙන ගෙට දුව ගියා ය. පාර දෙපස සිටිය බවලතුන් කොහේ ද කියා නැත. ආච්චිට පුපුරන්න කේන්ති ය. ''හතර විලි ලැජ්ජාවේ ඉන්න හැටියක් නෑ'' යි කියමින් ආච්චි ද ගෙට ගොඩ වැදුණා ය. මා කෙළින් ම ආතා දෙසට දුව යන විට ආතා සරම අඳිනවා ය. හැම තැනම විසිරුණු පොල් අතර මා සෙව්වේ කුරුම්බා තියනවා ද කියා ය.*

අපේ මාමා නොයෙකුත් තාලේ වැඩ කරන්නට දක්ෂ ය. හැම වැඩකින් ම වාගේ විශේෂයක් ඔහු තුළ ඇත. මැටි ඇඹීමට ඔහු රුසියෙකි. මාමා විසින් සාදන ලද මැටි පින්තූර කීපයක් අප පාසල් යන අවදියේ ද තාප්පය උඩ තබා තිබිණි. දුවන්නට, බයිසිකල් පදින්නට, ගස් යන්නට, පීනන්නට ආදී ඕනෑම දෙයකට මාමා දක්වන්නේ පුදුම තරම් දක්ෂකමකි. ඒ හැම දෙයකම විශේෂත්වයක් ද ඇත. පීනන්නට ගියොත් පීනන්නේ අමුතු ම විදියකට ය. සාමාන්‍ය ලෙස පීනන ගමන් වරක් උඩුබැලි අතට හැරී පීනයි. යළි දිය යටින් ගොස් කොහෙන් හෝ මතුවෙයි. අත් දෙකෙන් පමණක් පීනමින් සිට එකවිට දෑත් දෙපය එක්කොට පීනයි. මොකක් හෝ සාමාන්‍ය විදියට වඩා ටිකක් අමුතු ය.

ගස් නැග්ගත් නගින්නේ අමුතු විදියකට ය. ගස බඳට දකුණත් අල්ල තබා උදරය කෙලින් කර වම් අත දිගු කර ගස අල්ලා ගෙන ගසට පනියි. එලෙස ටික දුරක් ගොස් ඊලගට දෑතින් ම ගස බදාගෙන උඩට යන අතර පිනුම් ගසන ස්වරූපයෙන් ද ගසේ ඉහළට නගියි.

සයිකල් පදින්න ගියත් ඒ වගේ ය. නොයෙකුත් තාලයෙන් සයිකල් පදියි. හැඬල් එක අතහැර පදියි. එලෙස සයිකලය හිටගෙන පදියි. සයිකලයේ ප්‍රේම්එක මත වාඩි වී තනි කකුලෙන් පදියි. ඔය ආදී ලෙස නානාවිධ දස්කම් පාමින් සයිකල් පැදීමට මාමා රුසියෙකි.

යම්කිසි අමුත්තක සේයාවක් අපට දැනුණොත් නිතරම මාමා ගැන විපරම් කිරීම අප කාගේත් සිරිත ය. එක දවසක් උඩහ කඩේ ළඟ ඉඳන් ඉස්කෝලෙ ඉස්සරහ අලුත්වත්ත ළඟට යනතුරු පාර දෙපසට සෙනග එකා දෙන්නා අමුතු දෙයක් ගැන විපරමින් බලාගෙන සිටිනු දුටු මැණිකෙ පොඩි අම්මාත්, මමත් මිදුලට බැස්සෙමු. අල්ලිස් මාමාත්, නැන්දාත් ඒගොල්ලන්ගේ මිදුලේය. පියතිලක බාප්පාත්, ලීලා නැන්දාත්, සීල නැන්දාත්, මීගහතැන්නේ ආච්චීත් ඒගොල්ලන්ගේ මිදුලේය. ප්‍රේමතිලක බාප්පාත් ඒ ගෙදර අනිත් අයත් ඒගොල්ලන්ගේ මිදුලේ ය. චන්‍ද්‍රදාසලාගේ කඩේ මිදුලේ සෙනග පිරිලා ය. මේ ආකාරයෙන් ඒ ගමේ හැටියට සෑහෙන පිරිසක් පාර දෙපස ද සිටිති. අපි ද අමුත්ත කුමක්දෝ යි විපරමින් බැලුවෙමු.

ඉස්කෝලේ වංගුවෙන් වේගයෙන් එන බයිසිකලයකි. එන වේගයෙන් පැමිණෙන පුද්ගලයා කෙරේ විශේෂයක් ඇත. බයිසිකලය උඩ මාමා ය. දෑතින් අල්ලා ගත් හැන්ඩල් එක වැරෙන් ඔසවා ගෙන බයිසිකලයේ පිටුපස රෝදයෙන් පමණක් බයිසිකලය එයි. එසේ ආ බයිසිකලය චන්‍ද්‍රදාසලාගේ කඩේ ඉස්සරහදී ඉදිරිපස රෝදය ත් බිමට තබා දෙකකුල් ප්‍රේම් කඳ මතට ගෙන හැඬල් එක අත හැර දෑත් දෙපසට විහිදුවා ගෙන ඉදිරියට සාමාන්‍ය වේගයකින් එයි. එසේ ටික දුරක් පැමිණ නැවත සයිකලය වේගයෙන් පැදගෙන විත් අපේ ගෙය ද පසුකොට කන්ද දෙසට තරමක් පැද සයිකලය පිටුපසට ඒමට සලස්වයි. එවිට මාමා ඉදිරිය බලාගෙන සිටී. සයිකලය හෙමින් පිටුපසට එයි. වරක් සයිකලය වේගයෙන් පැදගෙන පැදගෙන ගොස් එක විට ම සයිකලය අතහැර හේ බිමට පනියි. හුදකලාව දුව යන සයිකලය පිටුපසින් දුවන මාමා නැවත සයිකලයට පනියි. මේ ආදී ලෙස නානා සෙල්ලම් පෙන්නමින් මාමා සයිකලය පදින අයුරු බලා සිටින පිරිස වරක් උරුහන් බාති. වරක මහා හඩින් සිනාසෙති.

මෙය බලා සිටි අපේ ආච්චිට කරකියා ගන්නට දෙයක් නැතුව දෑස් අයාගෙන බලා සිටියි. ''මුගේ හතර හංදි කඩා ගන්න හදනව ද කොහ ද? කාල තෙල වැටිලා, එක විදියක ඉන්න බැරුව අම්මප මේ කරගන්න හදන වින්නැහියක්. මේවා දකින කොට මගේ ඇගේ මාළු නටනවා. ඇයි හත් දෙයියනේ නිකන් ඉන්න බැරිනම් වත්තේ තියෙන තණකොළ ගහක් ගලවපිය කෝ ''ආච්චි තමන්ට ම කියා ගත්තා ය.

මේ අතර වාරයේ ආතා ද, පහළ ගග පැත්තේ සිට පොල් වලු දෙකක් දෑතින් ගෙන ගෙදර දෙසට එමින් සිටියේ ය. ඉස්කෝලෙ ඉදිරිපිට තිබෙන මහා කොස්ගස් දෙකෙන් මෑත් වුණු ආතාට මාමාගේ මේ හිතුවක්කාර පිනුම් ගැහිල්ල හදිසියේ ඇස ගැසුණි. ආතා එක විට ම පොල්වලු දෙක ඔසවා ගෙන ම මාමාගෙසයිකලය පිටුපසින් දුවන්නට විය. අඩි හත අටක් දුවන විට ආතාගේ සරම බුරුල්වී එක විටම බිම වැටිණි. අත තිබූ පොල්වලු දෙක එකවිට ම බිමට අතහල ආතා සරම අහුලා ගත්තේ ය. පාර දෙපස සිටි පිරිසට මැරෙන්න ට හිනා ය. මාමා කොහේ ගියා ද කියා නැත. කොල්ලෝ හූ කියමින් දගලනවා ය.

මැණිකෙ පොඩි අම්මාත් ''ඉකේයි'' කියාගෙන ගෙට දුව ගියා ය. පාර දෙපස සිටිය බවලතුන් කොහේ ද කියා නැත. ආච්චිට පුපුරන්න කේන්ති ය. ''හතර විලි ලැජ්ජාවේ ඉන්න හැටියක් නෑ'' යි කියමින් ආච්චි ද ගෙට ගොඩ වැදුණා ය. මා කෙළින් ම ආතා දෙසට දුව යන විට ආතා සරම අඳිනවා ය. හැම තැනම විසිරුණු පොල් අතර මා සෙව්වේ කුරුම්බා තියනවා ද කියා ය.

## මානවඩුගේ මාසය




ක්‍රිකට් නඩත්තුවට ඇ ඩොලර් 6 ක බැංකු අයිරාවක්

මානවඩු

ඔස්ට්‍රේලියාවේ පුවත්පතක කොටස් වශයෙන් පළ වූ පළමු සිංහල නවකතාව දැන් දයාවංශ ජයකොඩි සමාගමේ පොතක් ලෙස

**ජගත් ජේ එදිරිසිංහ ලියා**
**සිතිජය නමින් පහන මාසිකයේ කොටස් වශයෙන් පළ වූ ජනප්‍රිය නවකතාව**




තැපෑලෙන් ලබා ගැනීමට
**සූරිය මාකටිං සර්විසස්**
22 Lorne Street Lalor
Vic 3075 Australia
**දුරකතන 613 9402 5380**

දයාවංශ ජයකොඩි සහ සමාගම